**සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම - 2016/2017**

**-----------------------------------------------------------------------**

සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගමේ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 මාර්තු 31 දිනට සීමාසහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) විගණන මතයේ පදනම, විෂය පථය හා විගණනයේ සීමා කිරීම් මෙම වාර්තාවේ දක්වා ඇති පරිදි වේ.

(ආ) මාගේ විගණන මතය අනුව,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් මවිසින් ලබා ගන්නා ලද බවත්, මගේ පරීක්ෂණය මඟින් පෙනීයන පරිදි සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ නියමයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සටහන් අංක 30 අනුව, සමාගමේ නිෂ්පාදනය කරනු ලබන දැව්තෙල්වල නිෂ්පාදන පිරිවැය ඉතා ඉහළ අගයක් වීම හේතුවෙන් සමාගම දිගින් දිගටම අලාභ ලැබීමට පිළියමක් ලෙස, සමාගම ප්‍රතිසංවිධානය කිරීමට ඛනිජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් තීරණය කර තිබුණි. ඒ අනුව සමාගමේ පැවැත්ම පිළිබඳ සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) සමාගම විසින් 2017 මාර්තු 31 දින දක්වා දැව්තෙල් ලීටර් 69,630 ක්ද, එදින සිට 2017 ජුනි 30 දින දක්වා ලීටර් 19,070 ක්ද වශයෙන් දැව් තෙල් ලීටර් 88,700 ක් නිෂ්පාදනය කර තිබූ අතර නිෂ්පාදිතයන් අලෙවි කිරීමට වෙළඳපොළක් නොමැති වීම නිසා දැව් තෙල් ලීටර් 39,600 ක් පමණක් රු.40 බැගින් අලෙවි කර තිබුණි.

(ඇ) නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරගෙන යාමට නොහැකි වීම නිසා අපේක්ෂිත පරිදි නිෂ්පාදන ඉලක්ක කරා ළඟා වීමට නොහැකි වීම හා නිෂ්පාදනයේදී සෑම ඒකකයකින්ම රු. 310 ක නිෂ්පාදන අලාභයක් සිදු වී තිබුණි.

(ඇ) 2017 මාර්තු 31 දිනට භාණ්ඩාගාරයෙන් රු.මිලියන 240 ක් ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබුණ ද එදිනට ව්‍යාපෘතියෙන් ලද ආදායම රු.1,602,900 ක් පමණි. 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේදි සමාගම ලබා තිබූ අලාභය රු.35,174,148 ක් වන අතර එදිනට සමුච්චිත අලාභය රු.134,221,029 ක් විය. තවද, 2017 මාර්තු 31 දිනට සමාගමේ ජංගම වගකීම් එහි ජංගම වත්කම් රු. 10,545,823 කින් ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) සමාගමේ සභාපතිවරයා 2017 මැයි 23 වන දින ඉල්ලා අස් වී තිබූ අතර 2017 දෙසැම්බර් 12 දින වන විටත් නැවත සභාපතිවරයෙකු පත් කර නොතිබුණි.

(ඊ) සමාගමේ කාර්ය මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී ඇතුළුව නිලධාරින් තිදෙනෙකු ද ඉල්ලා අස් වී තිබුණු අතර ඒ සඳහා නැවත බඳවා ගැනීම් සිදු කර නොතිබුණි.

**2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

----------------------------------

ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.962,044 ක් වූ අයිතම 18 ක් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38

------------------------------------

ප්‍රමිතයේ 104 ඡේදය ප්‍රකාරව සීමිත ඵලදායී ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය කළ යුතු කාලය හා ක්‍රමය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීවත් සමාලෝචනය කළ යුතු වුවද, එසේ නොකිරීම හේතුවෙන් 2011 වර්ෂයේදී මිලට ගත් රු.252,944 ක් වටිනා පරිගණක මෘදුකාංගයක් සම්පූර්ණ වශයෙන් ක්‍රමක්ෂය කොට ගිණුම් පොත්පත් වලින් ඉවත් කොට තිබුණ ද තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

**-----------------------------------**

මහා භාණ්ඩාගාරයෙන් 2014 මාර්තු 31 සිට 2017 මාර්තු 31 දින දක්වා ලැබී තිබුණු එකතුව රු. 150,549,984 ක් සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ, රජයෙන් ලබා දුන් ණයක් ලෙස සටහන් කර තිබුණ ද එය සනාථ කර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ආයතනය තුළින් හෝ මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට නොහැකි විය.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**------------------------------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව<br>------------------------------------------ | අනුකූල නොවීම්<br>------------------- |
|---|---|
| (අ) 2009 පෙබරවාරි 19 වන දින මධ්‍යම පරිසර අධිකාරිය, ඉවතලන ප්ලාස්ටික් අපද්‍රව්‍යවලින් ඉන්ධන නිපදවීමේ පේටන්ට් බලපත්‍ර හිමිකරු සමඟ ඇති කර ගන්නා ලද බද්ධ ව්‍යාපාර ගිවිසුමේ 4.1 වගන්තිය සහ පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගමේ සාංසමික ව්‍යවස්ථාවලියේ 3.1 (1) (**i**) ව්‍යවස්ථාව | i. සමාගමේ නිකුත් කළ ප්‍රාග්ධනය කොටසක මිල රු.10 බැගින් වූ සාමාන්‍ය කොටස් 18,750,000 කින් සමන්විත වුව ද 2017 මාර්තු 31 දිනට ඉන් කොටස් 10 ක් පමණක් නිකුත් කර තිබුණි.<br><br>ii. විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය යටතේ පැවැති පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම 2015 සැප්තැම්බර් 21 දිනැති ගැසට් නිවේදනය මඟින් ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා ඇති නමුත් 2017 දෙසැම්බර් 31 දින වන තුරුත් එහි කොටස් අයිතිය පවරා නොතිබුණි. |
| (ආ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 167 වගන්තිය | වාර්ෂික වාර්තාවේ පිටපතක් කොටස් හිමියන්ගේ වාර්ෂික රැස්වීම පවත්වන දිනයට වැඩ කරන දින 15 කට පෙර සෑම කොටස්කරුවකු වෙතම යැවිය යුතු වුවද, 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගම විසින් වාර්ෂික වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | i. භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් තම පාලක මණ්ඩලයේ අනුමැතිය ඇතිව සිය සේවකයන්ට ගෙවීමට හැකි වුවත් ඊට පටහැනි ලෙස අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පරිදි විවිධ දීමනා ලෙස නිලධාරීන් 16 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.177,668 ක් ගෙවා තිබුණි.<br><br>ii. වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) හා වැඩබලන අභ්‍යන්තර විගණකට වැඩ බැලීමේ දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළ රු.341,244 ක් ගෙවා තිබුණි. |
| (ඈ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | යොමුගත චක්‍රලේඛයට පටහැනි අයුරින් කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකුට සමාලෝචිත වර්ෂයේ දී ප්‍රවාහන හා ඉන්ධන දීමනා ලෙස රු.600,400 ක් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඉ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 02/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සන්නිවේදන පහසුකම් හිමි නොවන රියදුරු සහ ආයතනික සහායකයන් දෙදෙනෙකු, ගිනිනිවීමේ උපදේශකයෙකු, ෆෝමන්වරයෙකු, පරිපාලන හා නිෂ්පාදන සහයකයෙකු සහ පුහුණු රසායනඥයෙකු සඳහා සන්නිවේදන පහසුකම් සැපයීම වෙනුවෙන් සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.102,000 ක් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.35,174,148 ක ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අලාභය රු.24,918,651 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.10,255,497 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේදී රු.1,602,900 ක විකුණුම් ආදායමක් හා රු.57,467 ක වෙනත් ආදායම් ලැබී තිබුණ ද, විකුණුම් පිරිවැය හා මෙහෙයුම් වියදම පිළිවෙලින් රු.4,098,808 කින් හා රු.7,819,681 කින් වැඩි වීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 02 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ රු.15,613,789 ක් වූ ශුද්ධ අලාභය සමාලෝචිත වර්ෂය වනවිට රු.35,174,148 දක්වා වර්ධනය වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිතෝෂික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් ගැලපීමෙන් පසු සමාගමේ 2014/2015 වර්ෂයේ රු.9,760,637 ක සෘණ අගයක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂය වනවිට රු.19,668,621 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉවතලන ප්ලාස්ටික් ඉන්ධන බවට පරිවර්තනය කිරීම මගින් අවිධිමත් ආකාරයට බැහැර කරන්නා වූ ප්ලාස්ටික් නිසා සිදුවන පරිසර ව්‍යසනය අවම කර ගැනීමත්, ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය සඳහා වැය වන පිරිවැය අවම කිරීම හා එමගින් විදේශ විනිමය ඉතිරි කර ගැනීමත්, නව නිපැයුම්කරුවකුගේ බුද්ධිමය දේපල ඇගයීම් කරනු වස් ඒ සඳහා වාණිජමය ලබා දී එම නව නිර්මාණය ජාතිකමය වූ වත්කමක් බවට පත් කිරීම මගින් තරුණ පරම්පරාව නව නිර්මාණ සඳහා යොමු කිරීමට අවශ්‍ය නව ආකෘතියක් හඳුන්වා දීමත්, ඉන්ධන නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තශාලාව මගින් ජනිත කරවන්නා වූ සෘජු රැකියා වලට අමතරව ඉවතලන ප්ලාස්ටික්, පොලිතින් එකතු කරන්නන් ලෙස ස්වයං රැකියා අවස්ථාවන් ජනිත කිරීමත්, ඉවතලන ප්ලාස්ටික් වලින් ලබා ගන්නා ඉන්ධන වෙනත් වටිනා නිෂ්පාදන බවට පරිවර්තනය කිරීමේ සහ ත්‍රිවිල් සඳහා යොදා ගත හැකි ඉන්ධනයක් බවට පත් කිරීමේ හැකියාව සොයා බැලීම සඳහා තවදුරටත් පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීමත්, තාක්ෂණික වශයෙන් ඉතා සුපිරි තත්ත්වයේ පවතින මෙම නව නිර්මාණය සඳහා ගෝලීය වශයෙන් පිළිගැනීමක් ඇති කර ගැනීම සඳහා එය තවදුරටත් පුළුල් කිරීම හා අලෙවිය සමාගමේ අරමුණ වේ.

(අ) මෙම ව්‍යාපෘතියේ ඉලක්ක ලඟා කර ගැනීමට පහත කාර්ය දර්ශකයන් ඇති කරගෙන තිබූ අතර අර්ධ වාණිජ ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වී තිබුණි. 2016/2017 වර්ෂයේ කාර්ය දර්ශක වලට අනුව ඉලක්ක ලඟා කර ගැනීම පහත පරිදි වේ.

i. ඉවතලන ප්ලාස්ටික් පරිසරයට මුදා හැරීම වැලැක්වීම සඳහා වසරකට ප්ලාස්ටික් කිලෝග්රෑම් 660,000 ප්‍රයෝජනයට ගැනීම ඉලක්කය වුවත්, ප්ලාස්ටික් කිලෝග්රෑම් 22,000 ක් පමණක් ප්‍රයෝජනයට ගෙන තිබුණි. ඒ අනුව ඉලක්ක ළඟා කර ගැනීම සියයට 3.3 ක් පමණක් විය.

ii. ඛනිජතෙල් නිෂ්පාදන ආනයන පිරිවැය අවම කිරීම තුළින් වාර්ෂිකව රු.මිලියන 30 ක විදේශ විනිමය ඉතිරි කිරීම ඉලක්ක කර තිබුණද එම ඉලක්කය ලඟාකරගෙන නොතිබුණි.

(ආ) ප්ලාස්ටික් අපද්‍රව්‍ය වලින් ඉන්ධන නිපදවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී නිසි පරිදි පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයන් නොකිරීම, නිෂ්පාදන සඳහා වෙළඳපොළ හඳුනා නොගැනීම, නියමු ව්‍යාපෘතිය අර්ධ වාණිජ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන බාධක හා ගැටළු හඳුනාගෙන ඒවා මග හරවා ගැනීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක නොකිරීම, අවශ්‍ය ප්‍රමාණවත් යටිතල පහසුකම් නොතිබීම, අරමුදල් නිසි කලට නොලැබීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී නිෂ්පාදන කළමනාකරණය ඉතා දුර්වල මට්ටමක පැවතීම වැනි කරුණු හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු කරා ළඟා වීමට නොහැකි වී තිබුණු බව පහත කරුණු සැලකීමේදි නිරීක්ෂණය විය.

i. ඉවතලන ප්ලාස්ටික් ඉන්ධන බවට පත්කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යනයේ දී පිරිවැය ප්‍රතිලාභ නිවැරදිව හඳුනාගෙන නොතිබීම හේතුවෙන් ලීටරයක විකුණුම් මිල රු.40 ක් වුවත් නිෂ්පාදන පිරිවැය රු.350 ක් වී තිබුණි.

ii. නිෂ්පාදනය කරන දැවිතෙල් බොයිලේරු සඳහා දහන ඉන්ධනයක් ලෙස භාවිතා කළ හැකි බව පමණක් හඳුනාගෙන තිබුණ නමුත් ඉන්ධන වෙළඳපොලේ දැඩි තරඟකාරීත්වය, ආදේශන ඉන්ධන භාවිතය, ආදේශණ ඉන්ධනවල තරඟකාරී මිලක් පැවතීම (භූමිතෙල්) ආදී කරුණු පිළිබඳව සැලකිලිමත් නොවීම නිසා නිපදවන ලද දැවිතෙල් අලෙවි කිරීම අසාර්ථක වු බැවින් විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මඟින් සමාගම විසින් නිපදවන ලද දැවිතෙල් ලීටර් 88,700 න් ලීටර් 39,600 ක් රු.40 බැගින් පෞද්ගලික ආයතනයකට අලෙවි කර තිබුණි.

iii. නියමු ව්‍යාපෘතියෙන් අත්කර ගත් ප්‍රතිඵල අනුව ඉවතලන ප්ලාස්ටික් ඉන්ධන බවට පත් කිරීමේ ක්‍රියාවලිය තාක්ෂණික , පාරිසරික හා ආර්ථික වශයෙන් සාර්ථක බව තීරණය කර පවතින තත්ත්වය මෙන් දස ගුණයක් විශාල අර්ධ වාණිජ පර්යන්තයක් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණද ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන බාධක, ගැටළු හඳුනාගෙන ඒවා මගහරවා ගැනීමට අවශ්‍ය සැලසුම් සකස්කර ක්‍රියාත්මක කර නොතිබුණි.

iv. අර්ධ වාණිජ පර්යන්තයක් බවට පත් කිරීමෙන් පසු ඒ සඳහා අවශ්‍ය ප්‍රමාණවත් යටිතල පහසුකම් පිළිබඳ අවධානය යොමු කර එම පහසුකම් කල්තියා සපයාගැනීමට සැලසුම් කර නොතිබුණි.

v. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ප්ලාස්ටික්, පද්ධතියට ඇතුල් කිරීම සඳහා නියමිත ක්‍රමවේදයක් ආරම්භයේ දී නොතිබුණු අතර නියමු ව්‍යාපෘතියේ සිට මේ දක්වා ක්‍රමවේද 05 ක් පමණ අත්හදා බලා තිබුණි. මේ වන විට ප්ලාස්ටික්, පද්ධතියට එකතු කරනු ලබන්නේ භාවිතයෙන් ඉවත් කරන ලද තෙල් සමඟ මිශ්‍ර කිරීමෙන් වන අතර මෙහි දී

නිෂ්පාදනය කරනු ලබන දැවිතෙල් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් භාවිතයෙන් ඉවත් කරන තෙල් යෙදවුම් වශයෙන් නිෂ්පාදන ක්‍රියාවලියට ඇතුළත් කර තිබුණි.

සමාගම විසින් 2017 මාර්තු 31 දින සිට ජුනි 30 දින දක්වා දැවිතෙල් ලීටර් 88,700 ක් නිෂ්පාදනය කර තිබුණු අතර මෙම කාලපරිච්ඡේදයන් තුළ ප්ලාස්ටික් සමඟ ඍජු හා වක්‍ර යෙදවුම් වශයෙන් භාවිතයෙන් ඉවත් කරන තෙල් ලීටර් 95,200 ක් යොදාගෙන තිබුණි. ඒ අනුව දැවි තෙල් ලීටරයක් නිපදවීම සඳහා යෙදවුම් වශයෙන් භාවිතයෙන් ඉවත්කරන ලද ලීටර් 1.07 ක් යොදාගෙන තිබුණි.

(ඈ) පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම විසින් 2017 මාර්තු 31 දිනට නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගත නොහැකි වැලි මිශ්‍රිත ප්ලාස්ටික් කුඩු කිලෝග්‍රෑම් 3,494 ක් ද, නිෂ්පාදන ක්‍රියාවලියේදී බැහැර කරන අපද්‍රව්‍ය ද්‍රව වශයෙන් ලීටර් 17,350 ක් ද, ඝන වශයෙන් කිලෝග්‍රෑම් 2,000 ක් ද, පරිසරයට බැහැර කිරීමේ හිතකර පිළිවෙතක් නොමැති බැවින් කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ටැංකි හා බහාලුම් වල ගබඩා කර තිබුණි. මෙම අපද්‍රව්‍ය පරිසර හිතකාමී හා නීත්‍යානුකූල අයුරින් බැහැර කිරීම සඳහා සමාගම ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් හඳුනාගෙන නොතිබුණි.

## 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) ඉවතලන ප්ලාස්ටික් ඉන්ධන බවට පරිවර්තනය කිරීම මඟින් අවිධිමත් ආකාරයට බැහැර කරන්නා වූ ප්ලාස්ටික් නිසා සිදුවන පරිසර ව්‍යසනය අවම කර ගැනීමේ ප්‍රධාන අරමුණින් යුක්තව 2009 අගෝස්තු 19 වන දින මධ්‍යම පරිසර අධිකාරිය යටතේ පිහිටුවනු ලැබූ පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම, 2010 ඔක්තෝබර් 04 දින සිට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය යටතටත් 2013 පෙබරවාරි 06 දින සිට තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතටත් පත් වූ අතර 2015 සැප්තැම්බර් 21 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවතුණි. මෙසේ සමාගම වෙනත් අමාත්‍යාංශයන් යටතට මාරු වීම හේතුවෙන් සමාගමේ කාර්යසාධනයට අහිතකර බලපෑමක් සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) මොරටුව විශ්ව විද්‍යාලය විසින්, සමාගමේ ප්‍රධාන නිෂ්පාදන කටයුත්ත වන ඉවතලන ප්ලාස්ටික් අපද්‍රව්‍ය වලින් ඉන්ධන නිපදවීමේ කටයුත්ත සඳහා තාක්ෂණික දැනුම සම්පාදනය කරනු ලබන අතර සමාගමේ ප්‍රකාශිත කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 10 ක හිමිකාරිත්වයක් දරනු ලබයි. එහෙත් සමාගම ස්ථාපනය කිරීමට අදාලව අත්සන් කරන ලද 2009 අප්‍රේල් 29 දිනැති බද්ධ ව්‍යාපාර ගිවිසුම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය පාර්ශවකරුවකු වී නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධනයට අනුව නිෂ්පාදන ඉලක්ක ලඟා කර ගැනීම සියයට 5.6 ක පමණ පහළ මට්ටමක පැවතියේදී අතිකාල දීමනා වශයෙන් කාර්ය මණ්ඩලයේ 20 දෙනෙකුට රු.2,349,576 ක් ගෙවා තිබූ අතර මින් රු.1,854,652 ක මුදලක් 12 දෙනෙකු වෙත ගෙවන ලද අතිකාල දීමනා වේ. මෙම අතිකාල දීමනා ප්‍රමාණය ඔවුන්ගේ වාර්ෂික මූලික වැටුපෙන් සියයට 35 ත් 55 ත් අතර පරාසයක විය.

## 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

(අ) සමාගමේ හොරණ පිහිටි පර්යන්තය සඳහා පනස් අවුරුදු බදු පදනම මත වසර 03 කට වරක් කුලිය සංශෝධනය වන පරිදි වසරකට රු.672,000 ක බදු කුලියට අක්කර 11කට ආසන්න ප්‍රමාණයෙන් යුත් ඉඩමක් 2011 ජුලි මාසයේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙන් ලබා ගෙන

තිබුණි. 2017 දෙසැම්බර් 31 දින දක්වා බදු කුලී වශයෙන් රු.4,379,864 ක් ගෙවා තිබුණ ද, අදාල පර්යන්තය සඳහා මෙම ඉඩම පිහිටි භූමියෙන් ප්‍රයෝජනයට ගෙන තිබුණේ අක්කරයකට වඩා අඩු ප්‍රමාණයක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) හොරණ පිහිටි පර්යන්තයේ දැවිතෙල් නිෂ්පාදන කටයුතු සඳහා දිනක සාමාන්‍ය ප්ලාස්ටික් පරිභෝජනය කිලෝග්‍රෑම් 250 ක් වන අතර 2017 මාර්තු 07 දිනට භාවිතා කල හැකි ප්ලාස්ටික් ක්ලෝග්‍රෑම් 5,546.50 ක තොගයක් පැවතුණ අතර එම තොගය පර්යන්තයේ වැඩ කරන දින 22 ක් සඳහා ප්‍රමාණවත්ව තිබියදී 2017 මාර්තු 13 දින රු.52,198 ක වටිනාකමකට ප්ලාස්ටික් කිලෝග්‍රෑම් 2,670 ක් මිලට ගෙන ඇති අතර එම තොගය 2017 සැප්තැම්බර් 15 දින පැවති අවසන් තොගය වූ කිලෝග්‍රෑම් 6,311 තුළ ඇතුළත් ව තිබුණි. කෙසේ නමුත් 2017 ජුනි 21 දින සිට පර්යන්තයේ නිෂ්පාදන කටයුතු නවතා තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වතකම්**

නියමු ව්‍යාපෘතිය සඳහා භාවිතා කරන ලද රු. 1,337,743 ක් වටිනා වැකුම් පද්ධතියක් (Vacuum unit) සමාගම අර්ධ වාණිජ ව්‍යාපෘතියක් බවට පත් වූ 2011 ජූලි මාසයේ සිට ප්‍රයෝජනයට ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

**4.5 සේවක මණ්ඩල කළමනාකරණය**

2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මාණ්ඩලික තනතුරු 05 ක් හා මාණ්ඩලික නොවන තනතුරු 19 ක්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ඇති කර ඒ සඳහා නිලධාරින් බඳවා ගෙන තිබූ අතර එසේ බඳවා ගත් නිලධාරීන් 24 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දී ගෙවන ලද මුළු පාරිශ්‍රමිකය රු.10,246,467 ක් විය.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කල යුතු වුවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශන දින 137 ක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 05(2) ඡේදය ප්‍රකාරව ව්‍යාපාරික සැලැස්ම පදනම් කරගෙන ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, මානව සම්පත් සංවර්ධන සැලැස්ම හා ණය ආපසු ගෙවීමේ සැලැස්ම ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**5.3 විගණන කමිටු**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 7.4.1 ඡේදයට අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් මාස 03 කට වරක් පැවැත්විය යුතු අතර එම රැස්වීම් 2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඊඩී/55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය. නමුත් සමාලෝචිත වර්ෂය තුළ එම අවශ්‍යතාවයන්ට අනුකූලව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි.

## 06. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගෙවීම් පාලනය | ඇතැම් ගෙවීම් කිරීමේ දී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල අනුමැතීන් ලබා නොගැනීම. |
| (ආ) | වත්කම් කළමණාකරණය | ස්ථාවර වත්කම් ලේඛණය විධිමත්ව පවත්වා නොතිබීම හා ඌණ උපයෝජිත වත්කම් පැවතීම. |
| (ඇ) | මානව සම්පත් කළමණාකරණය | අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති වීම. |